# මැතිවරණයෙන් බිඳවැටෙන මිථ්‍යා

වයඹ හා මධ්‍යම පළාත්වල පළාත් සභා මැතිවරණයෙන් සන්ධානයට ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලැබී ඇත. පුත්තලම් දිස්ත්‍රික්කයේ එක් ප්‍රදේශයක මැතිවරණය නැවත පැවැත්වීමට තීරණය කෙරී ඇති නමුත් ඉන් සමස්ත ප්‍රතිඵලය වෙනස් නොවන බව පැහැදිලි ය. මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ එ ජා ප පැරදී ඇති නමුත් ඔවුන් ඉන් පාඩමක් ඉගෙන නොගනු ඇත. මෙරට සංස්කෘතිය නොතේරෙන මේ නායකයන්ට ජනතාව මැතිවරණ ඔස්සේ එවන පණිවුඩ විවරණය කිරීමේ හැකියාවක් නැත. ඔවුන් ඉගෙන ගන්නේ බටහිරින් එන දූතයන්ගෙන් හා භූතයන්ගෙන් පමණකි.

පළාත් සභා මැතිවරණයෙන් මෙරට ඊනියා සුළු ජාතිකයන් (මෙය බ්‍රිතාන්‍යයින් විසින් අපට දෙන ලද අවුල් සංකල්පයක් පමණකි. මෙයට ද විකාශයක් ඇත. කලක් බ්‍රිතාන්‍යයෝ සිංහල හා දෙමළ මෙරට ජාතීන් ලෙස සැළකූහ.) පිළිබඳ තවත් මිථ්‍යා එකක් දෙකක් බිඳ වැටිණි. ඇතැම් පඬියන් ඇතුළු දෙමළ ජාතිවාදීන්, ඔවුන් වෙනුවෙන් කඩේ යන පඬියන්, රාජ්‍ය නොවන සංවිධානවල දාසයන් විසින් ප්‍රචාරය කරනු ලැබූ බොරු ප්‍රචාර රාශියක් වෙයි. දෙමළ ජාතිවාදය පවතින්නේ බොරුව හා බොරුව පදනම් කරගනිමිනි. ඉන් කිහිපයක් නිවැරදි කරමින් මෙහි සඳහන්කරන්නේ මේ ලිපියට පූර්විකාවක් ලෙස ය. පඬියන් කුමක් කීවද මෙරට දෙමළ ජනයාට අවුරුදු දෙදහස් පන්සීයක ඉතිහාසයක් නැත. අද යාපනයේ ජීවත්වන දෙමළ ජනයා දුම්කොළ වගාව සඳහා ලන්දේසීන් විසින් මෙරටට ගෙන්වන ලද කෘෂිකාර්මික කම්කරුවන් වූ වෙල්ලාලයන්ගෙන් ද එවකටත් එහි සිටි සිංහලයන්ගෙන් හා වේලක්කාරයන්ගෙන් ද පැවතෙන්නෝ වෙති. මගේ මිතුරකුට පොන්නම්බලම් අරුණාශලම් මහතාගේ පුතකු වූ මහාදේවන් මහතා පවසා ඇත්තේ තමන් ලංකාවට පැමිණ ඇත්තේ අවුරුදු දෙසීය පණහකට පමණ පෙර බව ය. ලන්දේසීහු වෙල්ලාලයන් ලංකාවට ද දකුණු අප්‍රිකාවට ද ගෙන ගියහ. අදත් එහි නැටෝල් ප්‍රදේශයෙහි වෙල්ලාලයෝ ජීවත් වෙති. (ලන්දේසීන් ලංකාවට හා දකුණු අප්‍රිකාවට දායක කර ඇති අනෙක් කරුණ නම් රෝම ලන්දේසි නීතිය ය.) අප අවුරුදු ගණනක් තිස්සේ මේ කරුණ අයිලන්ඩ් පුවත්පතෙහි ද සඳහන් කරන නමුත් තවමත් කිසිවකුවත් ඒ අභියෝගයට ලක්කර නැත. එසේ වුවත් එළාර රජු දෙමළ යැයි සිතන සිංහලයෝ මෙරට අවුරුදු දෙදහසකට වැඩි දෙමළ ඉතිහාසයක් ගැන තවමත් විශ්වාස කරති.  යාපන විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පළමු මහාචාර්යවරයා වූ කාර්තිගේසු ඉන්ද්‍රපාලන් මහතා සඳහන් කර ඇත්තේ දොළොස්වැනි සියවසට පෙර මෙරට ස්ථිර දෙමළ වාසස්ථාන නොතිබූ බව ය. අවුරුදු විස්සකට පමණ පෙර සසෙක්ස් විශ්වවිද්‍යාලයේ දී මට හමු වූ එංගලන්තයේ ජීවත්වන දෙමළ කථිකාචාර්යවරයකු පැවසුවේ මඩකලපු දෙමළ ජනයාගේ ඉතිහාසය පිළිබඳ ඔහු දන්නා තොරතුරු හෙළිකළහොත් ඔහු මරාදමනු ඇති බව ය. සුදුසු අවස්ථාවක මේ අයගේ නම් හෙළිකිරීමට කැමැත්තෙමි. එහෙත් තවමත් ඒ සඳහා අවස්ථාව නො වේ. (මහාදේවන් මහතා ජීවතුන් අතර නොමැති බැවින් ඔහුගේ නම සඳහන් කළ හැකි ය)

උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ ඊනියා නිජභූමි යන්න තවත් පට්ටපල් බොරුවකි. අවුරුදු තුන්සීයකට අඩු ඉතිහාසයක් ඇති මෙරට දෙමළ ජනයා බ්‍රිතාන්‍යයින් විසින් නැගෙනහිර පළාතේ පදිංචි කෙරී ඇත්තේ වෙරළ තීරුවේ මිස රට අභ්‍යන්තරයේ නො වේ. බ්‍රිතාන්‍යයින් විසින් 1889 දී අවසන් වරට සීමා අඳිනු ලැබූ පළාත් නවය පදනම් කරමින් ඊනියා නිජභූමි ගැන කතාකිරීම පඬියන්ට මුදල් උපයන මාර්ගයක් පමණකි. මේ පිළිබඳ භූගෝලවිද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය ජී. එච්. පීරිස් මහතා කර ඇති අධ්‍යයනය විශිෂ්ට ය. අම්පාරේ හිටපු දිසාපතිවරයකු වූ වයි ඩබ් ගුණවර්ධන මහතා පසුගිය දා පරිවර්තනය කර පළ කළ මඩකලපු වෘතාන්තය නමැති පොතෙහි මඩකලපුව ගැන තොරතුරු රාශියක් සඳහන් වෙයි. කෙසේ වෙතත් මා සමග එකට ඉගෙනගත් නීලන් තිරුචෙල්වම් මහතා තම ජීවිතයේ අවසන් කාලයේ දී ඊනියා නිජභූමි සංකල්පය ප්‍රතික්ෂේප කෙළේ ය.

දෙමළ ජනයාට ඇති ඊනියා අසාධාරණ ගැන කතාව තවත් බොරුවක් විය. දශක දෙකක පමණ කාලයක් තිස්සේ අසන දෙමළ ජනයාට දෙමළ වීම නිසාම පමණක් ඇති වී තිබෙන අසාධාරණය කුමක් ද යන ප්‍රශ්නයට තවමත් පිළිතුරක් නැත. ප්‍රභාකරන් ඊනියා යුද්ධයෙන් පරාජය කළ නොහැකි ය යන්න තවත් බොරුවක් විය. කොටි පරාද කළ නොහැකි බැවින් ඊනියා සාමකතා හැරෙන්නට වෙනත් විකල්පයක් නැතැයි පඬියෝ අපට කීහ. බලය බෙදීම හැරෙන්නට වෙනත් විසඳුමක් නැතැයි ඔවුහු උජාරුවෙන් කීහ. එහෙත් මේ නැති ප්‍රශ්නයකට වූ විසඳුමක් විය. කෙසේ වෙතත්

© Prof. Nalin De Silva

දෙමළ ජනයාගෙන් සියයට හැටක් පමණ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිට ජීවත්වෙත් දී දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නයක් ඒ පළාත්වලට බලය බෙදීමෙන් විසඳෙන්නේ කෙසේ දැයි ඔවුහු තවමත් නො කියති. කොටින් පැරදවිය හැකි බව හා පරාද (සමූලඝාතනය) කළ යුතු බව අප කියද්දී පඬියෝ අපට සිනහසුණහ. බෞද්ධයනට යුද්ධය අකැප යැයි පඬියෝ කීහ. තම්බයියා නම් පඬියෙක් ඒ සම්බන්ධයෙන් බුද්ධාගම පාවාදීම යනුවෙන් පොතක් ද පළකෙළේ ය. ජාතික ව්‍යාපාරයේ අපි ඒ සියල්ලට සම්මන්ත්‍රණ හා ලිපි ඔස්සේ පිළිතුරු දුන්නෙමු. බුද්ධදහම පාවාදීම යනුවෙන් කුඩා පොතක් ද දේශප්‍රේමී භික්ෂු පෙරමුණ විසින් පළකරන ලදී. එකල අද යුද වීරයන් වී ඇති බොහෝ දෙනා ඊනියා යුද්ධයට විරුද්ධව සිටි බව පමණක් මෙහි දී සඳහන් කරමු. කෙසේ වෙතත් ඔවුන් තම අදහස් වෙනස් කරගැනීම පිළිබඳ අපි සතුටු වෙමු.

අපට අද අදාළ මිථ්‍යාව වනුයේ ඊනියා සුළු ජාතීන්ගේ ඡන්ද නොමැතිව කිසිම පක්ෂයට බලයට පැමිණීමට නොහැකි ය යන්න ය. මෙය වැරදි බව අපි කීවෙමු. සිංහලයන්ගේ ඡන්දවලින් 60%ක් පමණ ලබාගත හැකිනම් බලයට පත්විය හැකි බව පෙන්වා දුන්නෙමු. ප්‍රශ්නය වූයේ සිංහලයන්ගේ ඡන්දවලින් 60%ක් පමණ ලබාගන්නේ කෙසේ ද යන්න ය. 1956න් පසු පළමු වතාවට මහින්ද චින්තන එයට පිළිතුරක් සැපයීය. රටේ ඒකීයභාවය ආර්ථික ප්‍රශ්නවලට වඩා වැදගත් විය. පාන් ගෙඩියට, පරිප්පු කිලෝවට ඡන්දය දුන් ජනතාව ඒකීය රාජ්‍යය ආරක්ෂා කරගැනීමට පෙළ ගැසුනහ. අවුරුදු සිය ගණනකට පසුව ජාතික මතවාද විජාතික මතවාද පරදවා ජයගත්තේ ය. (එහෙත් තවමත් ඒ ගැඹුරට කිඳා බැස නැත.) බටහිරයන්ගේ බලපෑම් හමුවෙහි කෙළින් සිටිය හැකි ආණ්ඩුවක් බලයට පත්විය. රණවිරුවන්ට නිවැරදි දේශපාලන නායකත්වය ලැබිණි. එදා අප හමුදාවට දේශපාලන නායකත්වය දිය යුතු යැයි කියන විට හමුදාව දේශපාලනීකරණයට ලක්කරන්නේ යැයි අපට චෝදනා කළ අය අද ඒ වචන ආඩම්බරයෙන් තෙපළති. අද කොටින් මුළුමනින් පරාජය කිරීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි. අද ද කොටි හා පඬියෝ අවසාන මොහොතේ දී පවා ඊනියා කොටු වූ සිවිල් වැසියන් ගැන බොරු කතා බටහිරයන් සමග හවුල් වී ප්‍රචාරය කරති. දෙමළ ජාතිවාදීහු තම වෑයම අත් නොකරිති. ඔවුහු නැවතත් පැරණි තැටිය වාදනය කරති. අප කුඩා රටක් බවත් අපට තනිවිය නොහැකි බවත් කියමින් බටහිරයන් කියන දේ අසා ඊනියා දේශපාලන විසඳුමක් දිය යුතු යැයි ඔවුහු කියති. මේ බොරුව ද පරාජය කළ යුතු ය. කුඩා රටවලට ද ආත්ම විශ්වාසයක් ඇත්නම් බටහිරයන්ට මුහුණ දිය හැකි බව ලංකාව පසුගිය අවුරුදු තුනක කාලයක පෙන්වා දී ඇත. දේශපාලන විසඳුම දී ඇත. ඒ කොටින් හමුදා ක්‍රියාමාර්ගවලින් පැරදවීම ය. සර්වපාක්ෂික නියෝජිත සමුළුවට අද කාර්යභාරයක් නැත. ඉඩම් කොමිසම් පත්කිරීම අද අවශ්‍ය නො වේ. කරුණා අම්මාන් තිස්ස විතාරණ මහතාට වඩා මේ කරුණු ගැන දන්නා බැවින් පොලිස් බලතල, ඉඩම් බෙදීමේ බලතල බෙදා දීමට විරුද්ධ ය.

අද දෙමළ ජනයා ද කොටි පැරදවීම ගැන ප්‍රීති වෙති. පසුගිය සතියේ පළාත්සභා මැතිවරණයේ දී සිංහලයන්ගේ ඡන්දවලින් 70%ක් පමණ ද සිංහල නොවන ඡන්දවලින් 45%ක් පමණ ද සංධානයට ලැබී ඇතැයි දළවශයෙන් ඇස්තමේන්තු කළ හැකි ය. ඒ වැරදි වුවත් සංධානයට ලැබෙන සිංහල ඡන්ද මෙන් ම සිංහල නොවන ඡන්ද ද වැඩි වී ඇත. බලයට පත් වී වසර තුනක් ගිය පසු ද ඡන්ද වැඩිවන්නේ ආණ්ඩුව ජාතික මතවාදවලට අනුව වැඩකරන බැවිනි. ලෝක ක්‍රිකට් කුසලාන දිනීමෙන් පසුව එයට වඩා ගැඹුරු හැඟීමකින් ජාතියක් ලෙස සිතීමට අද සියළු ජනයා පෙළ ගැසෙති. අවුරුදු පහළොවකට පමණ ඉහත ජාතික කොඩි තුනක් තිබිය යුතු බව අශ්රොෆ් මහතා සඳහන් කෙළේ ය. එවැනි ප්‍රශ්නවලට තාර්කික පිළිතුරු කාලය වෙබ් අඩවියෙන් බාගත හැකි ප්‍රභාකරන්, ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කෘතියෙහි සඳහන් වෙයි. අද දෙමළ ජනයා සිංහ කොඩිය ලෙළ දෙවමින් ප්‍රායෝගිකව ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙති. ජාතික ප්‍රතිපත්තියක හිඳිමින් සිංහල නොවන ඡන්ද ලබාගැනීමට නොහැකිය යන මිථ්‍යාව අද බිඳ වැටී ඇත. අනෙක් අතට විජාතික ප්‍රතිපත්තිවලට තැනක් නැති බව ද එ ජා පක්ෂය ඇතැම් ප්‍රදේශවල තම ඡන්ද පදනම 40% සිට 27% දක්වා අඩුකරගනිමින් පෙන්වා දී ඇත. එක් අතකින් රණවිරුවන්ට ප්‍රණාමය පළකරන පෝස්ටර අළවමින් අනෙක් අතින් විශ්වවිද්‍යාලවල දී ඒ රණවිරුවන්ට ම බිම දමාගෙන පහරදෙන ජ වි පෙරමුණේ දේශප්‍රේමය ජනතාව නොසළකන බව ද මැතිවරණයෙන් පෙනී යයි. මහින්ද චින්තන ප්‍රකාශකිරීමෙන් පසු සංධානයෙන් පිටත වූ ජාතික මතවාදයකට ජනතාව ඇහුම්කන් නො දෙති. එහෙත් කිවයුත්තක් වේ. කසිකබල් මාක්ස්වාදීන්ගේ හෝ බටහිරයන්ගේ හෝ කීමට සංධානය ජාතික මතවාද බැහැර කරන දින සංධානයේ වැටීම ආරම්භ වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva